<u>ව්‍යාපෘති යෝජනා සඳහා නිර්ණායක</u>

ශ්‍රී ලංකාවේ දිගුකාලීන ජනවාර්ගික ගැටුම හා එහි මුල හේතු සම්බන්ධව සැලසුම් කර ඇති, ප්‍රත්‍යක්ෂ දියුණුවක් අපේක්ෂිත ව්‍යාපෘතිවලට FLICT සහයෝගය දක්වයි. එම සංවිධානය අවධානය යොමුකරන ප්‍රධාන ඉලක්ක ක්ෂේත්‍ර තුනක් හරහා සැලසුම් කරඇති ව්‍යාපෘති මැදිහත්වීම්වලට එය සහාය දෙයි. එහි ලා යෝජනා ඉදිරිපත් කරනු ඇතැයි අපේක්ෂා කෙරේ.

- ඉදිරිපත් කෙරුනු යෝජනාවලියන් ලංකාවේ සාමය ගොඩනැංවීමේ ප්‍රයත්නයන්ට සමීප හා සෘජු අදාළත්වයක් ඇත.
- එසේම ඒවා ලංකා දේශපාලනයේ සහ සමාජයේ පවතින මධ්‍යම හා දිගුකාලීන ගැටුම් පරිවර්තන ධාරිතාව ශක්තිමත් කිරීමට සහාය දක්වයි.

<u>යෝජනා ඇගයීමේ ක්‍රියාවලිය</u>

FLICT වෙත ලැබෙන සියළු ව්‍යාපෘති යෝජනා පෙර සැලසුම් කල නිශ්චිත මිනුම් දඬු සපුරා ඇත්දැයි සෙවීමට අභ්‍යන්තර විමර්ශන ක්‍රියාවලියකට බඳුන් කෙරේ. ඉන් සමහරක් බාහිරව විමර්ශනය කෙරෙන අතර විටෙක අපගේ මෙහෙයුම් කමිටුව මගින් සියුම්ව විමසා බැලීමටද ඉඩ ඇත. මේ විමර්ශන ක්‍රියාවලිය ව්‍යාපෘති ඒකකයේ කිහිපදෙනෙක් සාමූහිකව සිදුකරති. විටෙක ව්‍යාපෘතියේ වලංගුභාවය හා පැවැත්ම ගැන බැහැරින් ද විමර්ශනය කෙරෙනු ඇත.

ව්‍යාපෘති යෝජනා ඇගයීමේදී FLICT සොයාබලන්නේ කුමක්ද ?
මූලිකව සලකා බලන මිනුම් දඬු කීපයක් පහත දැක්වේ.

1. FLICT ගේ ඉලක්ක ක්ෂේත්‍ර කෙරෙහි ව්‍යාපෘති අරමුණු හා යෝජිත ක්‍රියාකාරකම්වල අදාලත්වය
2. සංවිධානයේ කලමණාකරණ ශක්‍යතාව
3. යෝජනා ක්‍රියාත්මක කිරීමේ ප්‍රවේශය සහ විධි ක්‍රම
4. බලපෑම(ඉදිරිපත්කල ගැටුම් විශ්ලේෂණයට අනුව සුදුසු ලෙස වෙනස්කම් කරන ලද)
5. තිරසරභාවය(මූල්‍ය හා සංවිධානාත්මක)
6. පිරිවැය සඵලතාව

ව්‍යාපෘති යෝජනා සැකසීමේදී FLICT පහත කරුණු ගැන සොයා බලනු ඇත.

1. උපායමාර්ගික අවධානය

- අදාල ව්‍යාපෘතියෙන් සාමය ගොඩනැංවීමේ ක්‍රියාවලියට ධනාත්මක බලපෑමක් ලැබේ ද? නැතහොත් එය, ප්‍රචණ්ඩත්වයෙන් තොර ගැටුම් පරිවර්තනය කිරීමේ ක්‍රියාවලියට සහාය දෙනු ලබන්නේ ද?
- කවරාකාරයේ බලපෑමක් හෝ වෙනසක් අපේක්ෂිත ද? අපේක්ෂිත ප්‍රතිඵල හා බලපෑම, දියුණු කරන ලද වලංගු මිනුම් දඬු, හරි වැරදි බැලීමේ විධි ක්‍රම පැහැදිලිව හඳුනාගෙන තිබේ ද?
- වෙනස අපේක්ෂා කරන්නේ කවර මට්ටමේදී ද? එය සංකේතාත්මක මට්ටමේ වෙනසක් ද? ආයතනික මට්ටමේ වෙනසක් ද? නැතහොත් දැනුම් තේරුම් ඇති මට්ටමේ වෙනසක් ද?
- යෝජිත මැදිහත්වීමෙන් පසු සිදුවන වෙනස දිගටම පවතී ද?

2. සංවිධානයේ පරිපාලනමය ශක්‍යතාව

- සංවිධානය සතුව අදාළ ක්ෂේත්‍රය සම්බන්ධයෙන් පූර්ව අත්දැකීම් තිබේ ද? දැනටමත් එම ක්ෂේත්‍රයේ අත්දැකීම් ලබා ඇති කාර්ය මණ්ඩල සාමාජිකයන් සිටිත් ද?
- තම සංවිධානයෙන් ඵල ලැබූවන් සමග සම්බන්ධතා තිබේ ද?
- මූලික පරිපාලනමය හා ගිණුම්කරණ හැකියාව සංවිධානයට තිබේ ද?
- මේ සංවිධානය ක්‍රියාජාලයක කොටසක් ද?
- තම දක්ෂතා හැකියා හඳුනාගැනීමට සංවිධානය විසින් ස්වයං විශ්ලේෂණයක් කරනු ලැබ ඇත් ද?
- වෙනත් රාජ්‍ය හා රාජ්‍ය නොවන සංවිධාන සමග සහයෝගයෙන් මේ සංවිධානය වැඩකර තිබේ ද? වෙනත් සංවිධාන සමග කටයුතු කිරීමට කැමැත්තක් තිබේ ද?
- මේ සංවිධානය ප්‍රජාතාන්ත්‍රික ප්‍රතිපත්ති අනුව සකස්වී ඇත් ද? එසේ නම් එම ක්‍රියාවලිය අගය කරන්නේ ද? ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී හා මූල්‍ය පාලනයේ දී විනිවිද භාවයක් පෙන්වා තිබේ ද?
- සංවිධානය විසින් යෝජිත ස්වයංදායකත්වය කුමක් ද?

3. ඉලක්ක කණ්ඩායම්

- ඉලක්ක කණ්ඩායම් පිලිබඳ විස්තර ව්‍යාපෘතියට ඇතුලත් ද?
- සියලු ගැටුම් පාර්ශ්වයන්හි අභිලාෂ සැලකිල්ලට ගැනේ ද?

4. ප්‍රවේශය

- බහු පාර්ශ්වීය, සාර්වත්‍රික හා සහභාගිත්ව ප්‍රවේශයක් සංවිධානයට තිබේ ද?
- ව්‍යාපෘති ඇගයීමේ හා අධීක්ෂණය කිරීමේ යාන්ත්‍රණයක් සංවිධානයට තිබේ ද?
- යෝජිත මැදිහත්වීම්වල ප්‍රතිඵලය යම් දිශානතියකට යොමුව ඇත් ද?
- යෝජිත ක්‍රියාකාරකම්වල පිරිවැය සඵලතාවක් ඇත් ද? විකල්ප ප්‍රවේශ හා විධි ක්‍රම ගැන සැලකිල්ලක් දක්වා ඇත් ද?